සැ. යු. - 2018.04.12 දින පළ වූ අංක 2067 දරන ගැසට් පත්‍රයේ III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,068 - 2018 අප්‍රේල් මස 20 වැනි සිකුරාදා - 2018.04.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 868 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 870 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 872 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 876 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 884 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 මැයි මස 11 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 අප්‍රේල් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ටෙන්ඩර් කැඳවීම

මහනුවර මධ්‍යම පළාත්බද මහාධිකරණ කලාපයට අයත් නාවලපිටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද පහත දක්වෙන රන් භාණ්ඩ හා ගොල්ෆ් කට්ටලය ටෙන්ඩර් කැඳවා විකිණීම සඳහා ටෙන්ඩර් පත් 2018.05.10 දින පෙ.ව. 10.00 දක්වා බාර ගනු ලැබේ.

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය නාවලපිටිය**

**රන් භාණ්ඩ**

| | *නඩු අංකය* | *නඩු භාණ්ඩය* | *බර ප්‍රමාණය (g)* | *කැරට් ගණන* | *ආපසු ගෙවන ඇප තැන්පත් මුදල(රු)* |
|---|---|---|---|---|---|
| 01. | 31058 | පෙන්ඩනය සහිත මාලය | 24.14(g) | 16 | රු. 2,000.00 |
| | | රන් ගුලිය | 4.16(g) | 20 | රු. 2,000.00 |

**ගොල්ෆ් කට්ටලය**

| | *නඩු අංකය* | *නඩු භාණ්ඩය* | *ආපසු ගෙවන ඇප තැන්පත් මුදල(රු)* |
|---|---|---|---|
| 02. | AR/1944/15 | ගොල්ෆ් කට්ටලය | රු. 1,000.00 |

ටෙන්ඩර් ඉල්ලුම්කරු භාණ්ඩයට අයත් ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල මහනුවර මහාධිකරණයේ තැන්පත් කළ යුතු අතර ආපසු නොගෙවනු ලබන රු. 100.00ක මුදල ගෙවා ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර හා විස්තර ගැසට් නිවේදනයේ පළවූ දින සිට 2018.05.09 වන දින ප. ව. 03.00 දක්වා ටෙන්ඩර් ඉල්ලුම්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට මහනුවර මහාධිකරණයේ ගිණුම් අංශයෙන් ලබා ගත හැක.

මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් ප්‍රසම්පාදන කමිටුවේ, සභාපති, ගරු මහාධිකරණ විනිසුරු, මහාධිකරණය, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මහාධිකරණයට පැමිණ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් බහාලීම් කළ යුතුය. ටෙන්ඩර් පත් බහාලන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන භාණ්ඩය අනුව රන් භාණ්ඩ සඳහා ටෙන්ඩර් කැඳවීම - 2018 හෝ ගොල්ෆ් කට්ටල සඳහා ටෙන්ඩර් කැඳවීම 2018 ලෙස පැහැදිලිව සඳහන් කළ යුතු ය.

ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට කාර්යාල වේලාව තුළ අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර් හමු වී තම අනන්‍යතාවය තහවුරු කර අදාළ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

ටෙන්ඩර් පත් බාරගැනීම 2018.05.10 දින පෙ.ව. 10.00 ට අවසන් වේ. තැපෑලෙන් ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර් පත් බාරගනු නොලැබේ. තවද තක්සේරු වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කරණ ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප වේ.

ටෙන්ඩර් පත් බාරගන්නා අවසන් දින එනම් 2018.05.10 දින ප.ව. 1.00 ට ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් මහාධිකරණය මහනුවර වෙත පැමිණ සිටිය යුතු අතර එදින එම වේලාවට ටෙන්ඩර් පත් විවෘත කර මිල ගණන් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

අනතුරුව මහනුවර මහාධිකරණයේ ප්‍රසම්පාදන කමිටුව මගින් වැඩිම මිල ගණන් ඉදිරිපත් කළ ඉල්ලුම්කරුට ටෙන්ඩරය පිරිනැමීමට අවශ්‍ය කටයුතු කරනු ලබයි.

එම තීරණය අදාළ අධිකරණයට දැනුම් දීමෙන් අනතුරුව තමන්ගේ අනන්‍යතාවය තහවුරු කර අදාළ මුදල ගෙවීමෙන් පසුව භාණ්ඩ මුදා හරිනු ලබන අතර එදිනම එය රැගෙන යා යුතු වේ.

චෙක්පත් භාර නොගන්නා අතර මුදල් පමණක් භාර ගනු ලැබේ.

මෙම ටෙන්ඩරය සම්බන්ධයෙන් මහනුවර මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

මහාධිකරණ විනිසුරු,
ප්‍රසම්පාදන කමිටුවේ සභාපති,
මහාධිකරණය මහනුවර.

2018 අප්‍රේල් මස 04 වැනි දින,
මහනුවර මහාධිකරණයේ දී ය.

04-803

**ටෙන්ඩර් කැඳවීම**

මහනුවර මධ්‍යම පළාත්බඳ මහාධිකරණ කලාපයට අයත් පහත සඳහන් අධිකරණවල රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද රථ වාහන ටෙන්ඩර් මගින් විකිණීම.

පහත සඳහන් නඩු අංක සහිත වාහන සඳහා ටෙන්ඩර් පත් 2018.05.10 දින පෙ.ව. 10.00 දක්වා බාර ගනු ලැබේ.

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - නාවලපිටිය**

| | නඩු අංකය | වාහන අංකය | ආපසු ගෙවන ලද ඇප තැන්පත් මුදල (රු.) |
|---|---|---|---|
| 01. | 71145 | CP-YO-4834 ත්‍රිරෝද රථය (බජාජ්) | රු. 1,000.00 |

**දිසා/මහේස්ත්‍රාත් අධිකරණය - දඹුල්ල**

| | නඩු අංකය | වාහන අංකය | ආපසු ගෙවන ලද ඇප තැන්පත් මුදල (රු.) |
|---|---|---|---|
| 01. | 72922 | RA-3464 ටැෆේ වර්ගයේ මහ ට්‍රැක්ටරය | රු. 7,500.00 |

**මහේස්ත්‍රාත් අධිකරණය - මහනුවර**

| | නඩු අංකය | වාහන අංකය | ආපසු ගෙවන ඇප තැන්පත් මුදල (රු.) |
|---|---|---|---|
| 01. | 1179/07 | 68-0417 ලොරි රථය (ටොයෝටා) | 10,000.00 |
| 02. | 56301 | 43-0087 ලොරි රථය අබලි (ඉසුසු) | 5,000.00 |
| 03. | 65592 | CP-AAE-2718 ත්‍රිරෝද රථය (බජාජ්) | 5,000.00 |
| 04. | 6967 | 41-2653 ලොරි රථය අබලි (ඉසුසු) | 5,000.00 |
| 05. | 3687 | CP -LB-6881 ලොරි රථය (ටොයෝටා) | 10,000.00 |
| 06. | 80862 | 48-1362 ලොරි රථය (නිසාන් ඇට්ලස්) | 5,000.00 |
| 07. | 54122 | 227-7718 ලොරි රථය අබලි(නිසාන් ඇට්ලස්) | 2,000.00 |
| 08. | 44675 | 41-7260 ලොරි රථය අබලි (මිට්ෂුබිෂි) | 5,000.00 |

ටෙන්ඩර් ඉල්ලුම්කරු අදාළ වාහනයට අයත් ආපසු ගෙවන ලබන ඇප තැන්පත් මුදල මහනුවර මහාධිකරණයේ තැන්පත් කළ යුතු අතර ආපසු නොගෙවනු ලබන රු. 100.00 ක මුදල ගෙවා ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර හා විස්තර ගැසට් නිවේදනයේ පළවූ දින සිට 2018.05.09 වන දින ප.ව. 3.00 දක්වා ටෙන්ඩර් ඉල්ලුම්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට මහනුවර මහාධිකරණයේ ගිණුම් අංශයෙන් ලබා ගත හැක.

මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් **ප්‍රසම්පාදන කමිටුවේ සභාපති ගරු මහාධිකරණ විනිසුරු, මහාධිකරණය, මහනුවර** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මහාධිකරණයට පැමිණ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහා ලීම කළ යුතුය. ටෙන්ඩර් පත් බහාලන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ **රථ වාහන සඳහා ටෙන්ඩර් කැඳවීම - 2018 ලෙස හා වාහන අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.**

ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට කාර්යාල වේලාව තුළ අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර් හමු වී තම අනන්‍යතාවය තහවුරු කර අදාළ වාහන පරීක්ෂා කර බැලිය හැකිය.

ටෙන්ඩර් පත් බාර ගැනීම 2018.05.10 දින පෙ.ව. 10.00 ට අවසන් වේ. තැපෑලෙන් ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර් පත් බාර ගනු නොලැබේ. තවද තක්සේරු වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කරන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප වේ.

ටෙන්ඩර් පත් බාරගන්නා අවසන් දින එනම් 2018.05.10 දින ප.ව. 1.00 ට ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් මහාධිකරණය මහනුවර වෙත පැමිණ සිටිය යුතු අතර එදින එම වේලාවට ටෙන්ඩර් පත් විවෘත කර මිල ගණන් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

අනතුරුව මහනුවර මහාධිකරණයේ ප්‍රසම්පාදන කමිටුව මගින් වැඩිම මිල ගණන් ඉදිරිපත් කළ ඉල්ලුම්කරුට ටෙන්ඩරය පිරිනැමීමට අවශ්‍ය කටයුතු කරනු ලබයි.

එම තීරණය අදාළ අධිකරණයට දැනුම් දීමෙන් අනතුරුව වාහනයට අදාල මුදල ගෙවීමෙන් ටෙන්ඩර් කරුට හෝ බලය පැවරූ නියෝජිතයාට තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමෙන් පසුව වාහනය මුදා හරිනු ලබන අතර එදිනම එය අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු වේ.

චෙක්පත් භාර නොගන්නා අතර මුදල් පමණක් භාර ගනු ලැබේ.

මෙම ටෙන්ඩරය සම්බන්ධයෙන් මහනුවර මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

මහාධිකරණ විනිසුරු,
ප්‍රසම්පාදන කමිටුවේ සභාපති,
මහාධිකරණය මහනුවර.

2018 අප්‍රේල් 04 වැනි දින,
මහනුවර මහාධිකරණයේ දී ය.

04-804

---

# බඩු බාහිරාදිය විකිණීම්

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මොණරාගල**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හිමිකම් නොපාන ලද හා භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2018.05.05 වැනි සෙනසුරාදා පෙ. ව. 9.30 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් අධිකරණයේ රෙජිස්ට්‍රර් වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ඇතිව වෙන්දේසියට පැය භාගයකට පෙර විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් එවෙලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු ය.

06. වෙන්දේසියේ භාණ්ඩ මිල දී ගන්නා ගැණුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

එම්. ඩී. එස්. පී. දොඩම්ගොඩ,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
මොණරාගල.

2018 මාර්තු මස 27 වැනි දින,
මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 1. | 81366 | අත්ට්‍රැක්ටරය (ලි. ප. කළ හැකිය) |
| 2. | 55810 | යතුරුපැදිය (ලි. ප. කළ හැකිය) |
| 3. | 82009 | අත්ට්‍රැක්ටරය (අමතර කොටස්) |
| 4. | 81968 | අත්ට්‍රැක්ටරය (අමතර කොටස්) |
| 5. | 81421 | අත්ට්‍රැක්ටරය (අමතර කොටස්) |
| 6. | 82669 | අත්ට්‍රැක්ටරය (අමතර කොටස්) |
| 7. | AR 58/17 | අත්ට්‍රැක්ටරය (අමතර කොටස්) |
| 8. | 76156 | අත්ට්‍රැක්ටරය (අමතර කොටස්) |
| 9. | 83161 | අත්ට්‍රැක්ටරය (ලි. ප. කළ හැකිය) |
| 10. | 60658 | අත්ට්‍රැක්ටරය (අමතර කොටස්) |
| 11. | 65439 | මහ ට්‍රැක්ටර් ට්‍රේලරය (ලි.ප. කළ නොහැකිය) |
| 12. | 68961 | මහ ට්‍රැක්ටර් ට්‍රේලරය (ලි.ප. කළ නොහැකිය) |

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 13. | 80800 | මහ ට්‍රැක්ටර් ට්‍රේලරය (ලි.ප. කළ හැකිය) |
| 14. | 82439/78291 | ලොරියක අමතර කොටස් සඳහා |
| 15. | 80246 | චෙන්සෝ යන්ත්‍ර 01 යි |
| 16. | 82383 | චෙන්සෝ යන්ත්‍ර 01 යි |
| 17. | 82654 | චෙන්සෝ යන්ත්‍ර 01 යි |
| 18. | 82672 | චෙන්සෝ යන්ත්‍ර 01 යි |
| 19. | 59696 | චෙන්සෝ යන්ත්‍ර 01 යි |
| 20. | 79464 | කුඩා රේඩියෝවක් හා ජංගම දුරකථනයක් |
| 21. | BR 250/16 | කොම්පියුටර් කොටස |
| 22. | අංක රහිත | කරත්ත රෝද සෙට් 01 |
| 23. | අංක රහිත | කරත්ත රෝද සෙට් 01 |
| 24. | අංක රහිත | යකඩ ප්‍රමාණයක් |
| 25. | අංක රහිත | තැටි නගුල් තල 02 යි |
| 26. | අංක රහිත | අත් ට්‍රැක්ටර් බෙල්ට් ප්‍රමාණයක් |
| 27. | අංක රහිත | අත් ට්‍රැක්ටර් පන ගැන්වීමේ හැඩල් කිහිපයක් |
| 28. | 81594 | සවල් 01 යි |
| 29. | 81786 | සවල් 01 යි |
| 30. | 83005 | සවල් 01 යි |
| 31. | 83736 | සවල් 01 යි |
| 32. | 83991 | සවල් 01 යි |
| 33. | 83633 | සවල් 01 යි |
| 34. | 81267 | සවල් 01 යි |
| 35. | 33429 | සවල් 01 යි |
| 36. | 36721 | සවල් 01 යි |
| 37. | 84524 | උදළු 01 යි |
| 38. | 81631 | උදළු 01 යි |
| 39. | 85026 | උදළු 01 යි |
| 40. | 84196 | උදළු 01 යි |
| 41. | 85030 | උදළු 01 යි, තාච්චි 01 යි |
| 42. | 84191 | උදළු 01 යි |
| 43. | 84074 | උදළු 01 යි |
| 44. | 84011 | උදළු 01 යි |
| 45. | 71265 | උදළු 01 යි |
| 46. | 84006 | උදළු 01 යි |
| 47. | 83616 | උදළු 01 යි |
| 48. | 81785 | යකඩ බාල්දි 01 යි |
| 49. | 81784 | යකඩ බාල්දි 01 යි |
| 50. | 83634 | යකඩ බාල්දි 01 යි |
| 51. | 83635 | යකඩ බාල්දි 01 යි |
| 52. | 84288 | ඇළුමිනියම් මුට්ටි 02 යි |
| 53. | 82490 | ඇළුමිනියම් මුට්ටි 02 යි |
| 54. | 84075 | ඇළුමිනියම් මුට්ටි 02 යි |
| 55. | 82282 | ඇළුමිනියම් මුට්ටි 02 යි |
| 56. | 83063 | කැති 01 යි |
| 57. | 58580 | කැති 01 යි |
| 58. | 63149 | කැති 01 යි |
| 59. | 69687 | කැති 01 යි |
| 60. | 69505 | කැති 01 යි |
| 61. | 69692 | කැති 01 යි |
| 62. | 73141 | කැති 01 යි |
| 63. | 73577 | කැති 01 යි |
| 64. | 38790 | පොරව 01 යි |
| 65. | 58473 | පොරව 01 යි |
| 66. | 69222 | පොරව 01 යි |
| 67. | 68776 | පොරව 01 යි |
| 68. | 68887 | පොරව 01 යි |
| 69. | 75684 | පොරව 01 යි |
| 70. | 71454 | පොරව 01 යි |
| 71. | 74843 | පොරව 01 යි |
| 72. | 75843 | පොරව 01 යි |
| 73. | 75204 | පොරව 01 යි |
| 74. | 81901 | තරාදි 01 යි |
| 75. | 81902 | තරාදි 01 යි |
| 76. | 81652 | ඉල්ලන් කුරු 01 යි |
| 77. | 74545 | යකඩ ඉනි 01යි |
| 78. | අංක රහිත | පනිට්ටු 01 යි |
| 79. | අංක රහිත | පනිට්ටු 01 යි |
| 80. | අංක රහිත | පනිට්ටු 01 යි |
| 81. | අංක රහිත | පනිට්ටු 01 යි |
| 82. | අංක රහිත | පනිට්ටු 01 යි |
| 83. | අංක රහිත | පනිට්ටු 01 යි |
| 84. | අංක රහිත | පනිට්ටු 01 යි |
| 85. | අංක රහිත | පනිට්ටු 01 යි |
| 86. | අංක රහිත | පනිට්ටු 01 යි |
| 87. | අංක රහිත | පනිට්ටු 01 යි |
| 88. | අංක රහිත | පනිට්ටු 01 යි |
| 89. | අංක රහිත | පනිට්ටු 01 යි |
| 90. | අංක රහිත | පනිට්ටු 01 යි |
| 91. | අංක රහිත | දුනු තරාදි 01 යි |
| 92. | අංක රහිත | තැටි තරාදි 01 යි |
| 93. | අංක රහිත | සවල් 01 යි |
| 94. | අංක රහිත | සවල් 01 යි |
| 95. | අංක රහිත | සවල් 01 යි |
| 96. | අංක රහිත | සවල් 01 යි |
| 97. | අංක රහිත | පොරෝ 01 යි |

04-593

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**මඩකලපුව දිස්ත්‍රික්කය - ඒරාවූර් පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2018/2019 වර්ෂය

**2018 ජූලි මස සිට 2019 ජුනි මස දක්වා - ආරුමුගත්තාන් කුඩියිරුප්පු රා තැබෑරුම් රේන්ද විකිණීම**

අංක 207 දරන 1982.08.20 දින ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළ කරන ලද 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධානයේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආරුමුගත්තාන් කුඩියිරුප්පු රා තැබෑරුම් සඳහා 2018 ජූලි මස 01 වැනි දින සිට 2019 ජුනි මස 30 වැනි දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් විසින් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතු ය.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රු. 1,500 ක මුදලක් ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් නමින් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉල්ලුම්පත ලබා ගත හැකි ය. ටෙන්ඩර්පත් සමග රිසිට්පත අමුණා තිබිය යුතු ය. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ 2018.05.02 දින සිට 2018.05.18 දින ප. ව. 3.00 දක්වා වේ.

02. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් බදු පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% කට නොඅඩු නොවිය යුතු ය. මෙම වටිනාකම් සහතිකය ටෙන්ඩර් සමග ඇමිණිය යුතු ය.

03. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේ නම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් නොකර ටෙන්ඩර්පත්‍ර සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍ය නම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කරන ලද දින සිට සති දෙක ඇතුළත ඔබ විසින් ලබාගත් ටෙන්ඩර්පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත් සමග නැවත ඉදිරිපත් කරන්නේනම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

05. දැනට තිබෙන තැබෑරුම් ඉඩම් ඉදිරි කාලවලටත් තිබේදැයි සහතික නැත.

06. ලියාපදිංචි කරන ලද පොල් සහ තල් සංගම් මෙම රේන්ද විකිණීමේ දී සහභාගි වන්නේ නම් සංගම පිහිටා තිබෙන ප්‍රදේශයට රා තැබෑරුමට පමණක් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ හැකි ය. ඒ සමග සංගම දැනට ක්‍රියාත්මක වන බවටත් සංගමය විසින් රා තැබෑරුම් බදු ගෙන පවත්වා ගෙන යාමට හැකියාව තිබීම සම්බන්ධව මඩකලපුව දිස්ත්‍රික් සමුපකාර සහකාර කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 දරන හා 2012.01.05 වැනි දිනැති චක්‍රලේඛයට අනුව).

07. අතිකුත් තොරතුරු ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

එන්. විල්වරත්නම්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ඒරාවූර් පත්තුව,
වෙංකලඩි.

2018 මාර්තු මස 14 වැනි දින,
ඒරාවූර් පත්තුව,
වෙංකලඩි.

**රා තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය**

| *තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුමේ අංකය* | *ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* | |
|---|---|---|---|
| | | *දිනය* | *වේලාව* |
| ආරුමුගත්තාන් කුඩියිරුප්පු | TT No. 1 | 2018.05.30 | පෙ. ව. 10.00 |

*සටහන* .- 1. ටෙන්ඩර් කමිටුව 2018.05.30 වැනි දින පෙ. ව. 10.00 ට රැස්වේ.

2. විකිණුම් දිනයේ සුදුසු බදුකරු තෝරා නොගත්තොත් නැවත විකිණීම් 2018.06.08 වැනි දින පෙ. ව. 10.00 ට පැවැත්වේ.

04 -565

---

**මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - මඩකලපුව දිස්ත්‍රික්කය**

කෝට්ටමුනේ TT - 2 රා තැබෑරුම් රේන්ද නැවත විකිණීම - 2018 ජූලි - 2019 ජුනි

1982.08.20 වැනි දින ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධාන අනුව මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කෝට්ටමුනේ රා තැබෑරුම් සඳහා 2018 ජූලි මස 01 දින සිට 2019 ජුනි මස 30 දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වන ටෙන්ඩර් මණ්ඩල රැස්වීම සඳහා සහභාගි විය යුතු යි.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රුපියල් එක්දහස් පන්සියයක (රු. 1,500) මුදලක් මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් නමින් මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත සහ වටිනාකම් සහතිකය ඉදිරිපත් කිරීමෙන් ඉල්ලුම්පත ලබා ගත හැකි ය. ටෙන්ඩර්පත සමග රිසිට්පත අමුණා තිබිය යුතු ය. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ 2018.05.10 වැනි දින සිට 2018.05.24 වැනි දින පස්වරු 3.00 දක්වා.

02. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% ට අඩු නොවිය යුතු ය. මෙම වටිනාකම් සහතිකයේ මුල් පිටපත ටෙන්ඩර් පත්‍ර සමග එවිය යුතු අතර මේ වටිනාකම් සහතිකය සමග ඉඩම් රෙජිස්ට්‍රාර්තුමා විසින් ලබාදෙන ඉඩම් ලේඛන සටහන් ලසු පිටපත් අමුණා එවිය යුතුයි. (මෙම වටිනාකම් සහතිකය ටෙන්ඩර්පත් නිකුත්කිරීමට පටන් ගත් දිනයෙන් පසුව ලබාගත යුතුයි)

03. ටෙන්ඩර්පත් ඉදිරිපත් කරන ලිපි කවරය තුළ ඔබ විසින් ඉදිරිපත් කරන ලිපි ලේඛණවල පිටපත් නව ලිපි කවරය තුළ දමා එම කවරය ඇලවීමෙන් පසුව ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුයි.

04. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබීම හා ඉහත 2 වැනි ඡේදයේ සඳහන් පරිදි ලේඛනය අමුණා නොමැති නම් එම ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ටෙන්ඩර්පත් ඉදිරිපත් නොකර ටෙන්ඩර්පත් සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍ය නම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ දින සිට සති දෙකක් තුළ ඔබ ලබා ගත් ටෙන්ඩර්පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත සමග නැවත ඉදිරිපත් කරන්නේ නම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

06. තැබෑරුම දැනට පවත්වන ස්ථානයේ දී ම ඉදිරි කාලයේ අඛණ්ඩව තිබේදැයි සහතික කළ නොහැක.

07. ලියාපදිංචි කළ පොල් හා තල් සමුපකාර සමිතිය මෙම රේන්ද විකිණීමේ දී සහභාගි වන්නේ නම් සමිතිය පිහිටුවා ඇති ප්‍රදේශයට අයත් රා තැබෑරුම සඳහා පමණක් ඉල්ලුම්පත ඉදිරිපත් කළ හැකි අතර, දැනට සමිතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව හා රා තැබෑරුම් බදු ගෙන පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව ද මඩකලපුව දිස්ත්‍රික් සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 හා 2012.01.05 වැනි දින දරන චක්‍රලේඛය අනුව තිබිය යුතු ය.)

08. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

කේ. කුණනාදන්,
ප්‍රාදේශීය ලේකම්.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මන්මුනේ උතුර, මඩකලපුව.

**රා තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය**

| *රා තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* | |
|---|---|---|---|
| | | *දිනය* | *වේලාව* |
| මඩකලපුව මහ නගර සභා මායිම තුළ | TT 2 | 2018.05.24 | ප. ව. 3.00 |

***සටහන*** .- 1. ටෙන්ඩර් මණ්ඩල 2018.05.24 වැනි දින පස්වරු 3.00 ට රැස්වේ.
2. විකුණුම් දින සුදුසු බදුකරු තෝරා නොගතහොත් නැවත විකිණීම 2018.06.06 වැනි දින ප. ව. 3.00 ට පැවැත්වේ.

04-730

---

**පුත්තලම දිස්ත්‍රික්කය**

නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

**රා තැබෑරුම් රේන්ද විකිණීම - 2018/2019 වර්ෂය**

***2018.07.01 සිට 2019.06.30 දක්වා***

2018 ජූලි මස 01 වැනි දින සිට 2019 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයක්ම සඳහා අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් රා තැබෑරුම් රේන්ද විකිණීම සඳහා වූ ටෙන්ඩර් 2018.05.21 වැනි දින පෙ. ව. 10.30 දක්වා ම විසින් භාරගනු ලැබේ.

02. ඔබගේ ටෙන්ඩරය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි ටෙන්ඩර් පත්‍රයක සකස් විය යුතු අතර නියමිත ඇප තැන්පත් කුවිතාන්සියක් ද අදාළ ටෙන්ඩරයේ සඳහන් මිලෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුන් වම් කෙළවරේ ''අංක 01 මූදුකටුව රා තැබෑරුම'' හෝ ''අංක 02 කටුනේරිය රා තැබෑරුම'' සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි රා තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2018.05.21 වැනි දින පෙ.ව.10.30 ට පෙර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද විකිණීමේ කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2018.05.21 වැනි දින පෙ.ව.10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2018.06.07 වැනි දින 10.30 ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අදළ විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. (032 - 2254486)

විජානි වසන්තිකා,
සහකාර ප්‍රාදේශීය ලේකම්,
නාත්තන්ඩිය.

2018 ක් වූ අප්‍රේල් මස 05 වැනි දින,
නාත්තන්ඩිය,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

*උපලේඛනය*

| *තැබෑරුම් අංකය* | *ග්‍රාමය* | *තැන්පත් මුදල රු.* |
|---|---|---|
| 01 | මූදුකටුව | 1,000.00 |
| 02. | කටුනේරිය | 1,000.00 |

04-737

---

**ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - වෙන්නප්පුව**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2018/2019

2018 ජූලි මස 01 වැනි දින සිට 2019 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්වන කොන්දේසි මාලාවන්ට යටත්ව පහත දැක්වෙන උපලේඛනයන්හි සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රයක සකස් විය යුතු වන අතර, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් මුදල්, තැන්පත් කළ බවට කුවිතාන්සියක් හා අදාළ සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ "අංක .......................... දරන ............................................. රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුම් අංකය සහ නම සඳහන් කොට 2018 මැයි මස 08 වැනි දින සිට 2018 මැයි මස 22 වැනි දින පෙ. ව. 10.30 ට පෙර වෙන්නප්පුව ප්‍රාදේශීය මහ ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට, පෙර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 දින පනවා ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙන් දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2018.05.22 වැනි දින පෙ.ව. 10.30ට ටෙන්ඩර් පත්‍ර බාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් වෙන්නප්පුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වන රා තැබෑරුම් නැවත විකිණීම 2018.06.11 වැනි දින පෙ.ව 10.30 ට සිදුකරනු ලැබේ. එදින ද ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය. (0318855238)

යූ. එස්. එන්. ප්‍රනාන්දු,
ප්‍රාදේශීය ලේකම්,
වෙන්නප්පුව.

**උපලේඛනය**

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම් ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|
| 01 | වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තඹරවිල | 2018.05.22 පෙ.ව. 10.30 ට | 500 0 |
| 02. | එම | නාත්තුන්ඩන්කරය | එම | 250 0 |
| 03. | එම | වයික්කාල | එම | 1,000 0 |
| 04. | එම | බොරලැස්ස | එම | 500 0 |
| 05. | එම | දුම්මලදෙනිය | එම | 1,000 0 |
| 06. | එම | උල්හිටියාව | එම | 500 0 |
| 07. | එම | ලුණුවිල | එම | 500 0 |
| 08. | එම | වෙන්නප්පුව | එම | 2,000 0 |
| 09. | එම | නයිනමඩම | එම | 1,000 0 |

| *තැබෑරුම් විවෘත කරන වේලාව :* | *තැබෑරුම් වැසිය යුතු වේලාව :* |
|---|---|
| පෙ. ව. 11.00, | ප. ව. 2.00, |
| ප. ව. 5.00 ට | ප. ව. 8.00. |

04-915

# රජයේ නොවන දැන්වීම්

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ සීමාසහිත පුද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීම පිළිබඳ දැනුම් දීමයි.

සමාගමේ නම : වයඹ එස් ඇන්ඩ් එස් මයිකො කෙඩිට් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්

සමාගමේ අංකය : පී වී 129286

සමාගම සංස්ථාපනය කළ දිනය : 2018.01.26

ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 29/B, කලුගමුව පාර, වාරියපොළ.

සමාගම් ලේකම් : ධම්මික කුලරත්න.

04-567

## ප්‍රසිද්ධ දැන්වීම

ග්ලෝබල් කන්සොලිඩේටර්ස් ලංකා (පුද්ගලික) සමාගම (සමාගම් අංකය පී වී 127855) වර්ෂ 2017 දෙසැම්බර් මස 07 වැනි දින සංස්ථාගත කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) උපවගන්තිය ප්‍රකාරව මෙයින් සැම දෙනාගේ ම දැනගැනීම පිණිස දැනුම් දෙනු ලැබේ.

ලියාපදිංචි කාර්යාලය : අංක 162, පේරලන්ද, රාගම, ශ්‍රී ලංකාව.

04-578/1

## ප්‍රසිද්ධ දැන්වීම

රොචෙස්ටර් ඉවෙන්ට්ස් ඇන්ඩ් මීඩියා (ප්‍රයිවෙට්) ලිමිටඩ් (සමාගම් අංකය පී වී 123679) වර්ෂ 2017 ජූලි මස 07 වැනිදින සංස්ථාගත කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) උප

වගන්තිය ප්‍රකාරව මෙයින් සැම දෙනාගේ ම දැනගැනීම පිණිස දැනුම් දෙනු ලැබේ.

ලියාපදිංචි කාර්යාලය : 3 1/3, බත්තරමුල්ල පාර, කෝට්ටේ, ශ්‍රී ලංකාව.

04-578/2

---

## පොදු නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) ඡේදය යටතේ ''ත්‍රී ෆිෆ්ටි ඇට් යුනියන් (පීවීටී) එල්ටීඩී'' නාමය 2018 මාර්තු 15 වැනි දින සංස්ථාගත කළ බව මින් නිවේදනය කරනු ලැබේ.

සමාගම් නාමය : ත්‍රී ෆිෆ්ටි ඇට් යුනියන් (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පී වී 130733
ලියාපදිංචි කාර්යාලය : අංක 25, රීන්ලන්ඩ් පෙදෙස, කොළඹ 03

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ත්‍රී ෆිෆ්ටි ඇට් යුනියන් (පීවීටී) එල්ටීඩී,
බ්‍රැන්ඩික්ස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

04-579

---

## පොදු නිවේදනය

සමාගම් පනතේ 8 ඡේදයේ නියමයන්ට අනුකූලව ''ෆීනික්ස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්'' නාමය ''මූස් ක්ලෝතින් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්'' වශයෙන් 2018 පෙබරවාරි 09 දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කළ බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) ඡේදය යටතේ මින් නිවේදනය කරනු ලැබේ.

සමාගම කලින් හැඳින් වූ නාමය : ෆීනික්ස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 17983
ලියාපදිංචි කාර්යාලය : අංක 36, 2 වැනි හරස් වීදිය, කොළඹ 11
සමාගමේ නව නාමය : මූස් ක්ලෝතින් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

මූස් ක්ලෝතින් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්,
බ්‍රැන්ඩික්ස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

04-580

---

## පොදු නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) ඡේදය යටතේ ''ග්‍රැෆියෝ ෆයිව් (ප්‍රයිවට්) ලිමිටඩ්'' නාමය 2018 පෙබරවාරි 28 වැනි දින සංස්ථාගත කළ බව මින් නිවේදනය කරනු ලැබේ.

සමාගම් නාමය : ග්‍රැෆියො ෆයිව් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 130315
ලියාපදිංචි කාර්යාලය : අංක 25, රීන්ලන්ඩ් පෙදෙස, කොළඹ 03

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ග්‍රැෆියෝ ෆයිව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
බ්‍රැන්ඩික්ස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

04-581

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන අනුව 2018 මාර්තු 26 වැනිදා ආරම්භ කරන ලද පහත සඳහන් සමාගම ගැන කරනු ලබන දැනුම් දීමයි.

සමාගමේ නම : ඔටෝ ආකේඩ් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 131137
ලියාපදිංචි ලිපිනය : අංක 457, කොළඹ පාර, පැපිළියාන, බොරලැස්ගමුව.

ජේසී සහ සමාගම,
සමාගම් ලේකම්වරු.

අංක 9/5, තම්බයියා වීදිය,
කොළඹ 07.

04-585

---

## සමාගමක් සංස්ථාගත කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : ජියෝහාබර් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2018.02.12
සමාගමේ ලියාපදිංචි අංකය : PV 129755
ලියාපදිංචි ලිපිනය : ප්ලැටිනම් 1, අංක 13 - C නිවාස සංකීර්ණය, බගතලේ පාර, කොළඹ 04

ඩී. සී. රවීන් වික්‍රමසිංහ,
සමාගමේ ලේකම්.

04-594

## ඇටර්නි බලය අවලංගු කිරීම

මාතර පල්ලිමුල්ල සම්බෝධි මාවතේ අංක 27/17 හි පදිංචි දේවසුරේන්ද්‍ර ෆ්‍රිල් ගාමිණී වන මම මාගේ ඇටර්නි බලකරු ලෙස මාතර කොටුව තොටුපල පාර අංක 19 හි පදිංචි කොග්ගල මරක්කලගේ කිත්සිරි ඉරාජ් යන අයව පත් කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් මඩවිට පටබැඳිගේ චන්ද්‍රිකා ශ්‍යාමලී නෙළුම් කුමාරි විසින් වර්ෂ 2015.01.30 වැනි දින සහතික කරන ලද අංක 491 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු හා බලරහිත කරන බව ශ්‍රී ලංකා ජනරජය වෙත හා මහජනතාව වෙත ද මෙයින් දැනුම් දෙමි. තවද, එකී විශේෂ ඇටර්නි බලපත්‍රය ප්‍රකාරව මින් ඉදිරියට එකී ඇටර්නි බලකරු විසින් සිදු කරන කිසිම ගනුදෙනුවකට මාගේ බැඳීමක් හෝ වගකීමක් නොමැති බව ද දන්වමි.

දේවසුරේන්ද්‍ර ෆ්‍රිල් ගාමිණී.

04-614

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 11 (5) වන වගන්තිය අනුගාමීව කෙරෙනු ලබන ප්‍රසිද්ධ දැන්වීමයි.

ලියාපදිංචි අංක පීබී 242 හා ලියාපදිංචි කාර්යාලය, කොළඹ 03, පාම්ග්‍රොව්හි අංක 27 පිහිටි මර්කන්ටයිල් ෂිපිං ඒජන්සීස් ලිමිටඩ් සමාගමේ සාමාජිකයින් විසින්, 2018 මාර්තු 27 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී එම සමාගම ඉහත සඳහන් පනතේ 29 වගන්තියේ විධිවිධාන අනුගාමීව පුද්ගලික සමාගමක් බවට පරිවර්තනය කිරීම පිණිස සභා සම්මත කොට ගත් අතර ඒ අනුව අදාළ සමාගමේ නාමය ඉහත පනතේ 11 වගන්තිය ප්‍රකාරව වෙනස් කොට ඇති බවත් ඒ අනුව නව සමාගමේ නාමය මර්කන්ටයිල් ෂිපිං ඒජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් මින් ඉදිරියට හඳුන්වන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂක.

2018 මාර්තු මස 28 වැනි දින.

04-615

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැනුම් දීමයි.

සමාගමේ නම : රෝයල්ග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 129427
ලියාපදිංචි දිනය : 2018.02.01
ලියාපදිංචි ලිපිනය : අහස්පොකුණ වත්ත, අංක 220, බරන්දන, හිඳගොල්ල.

සමාගම් ලේකම්.

04-621

## දැන්වීමයි

ටැන්සින්ග් (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 20346) සහ ලැමුරෙප් ඉන්වෙස්මන්ට්ස් ලිමිටඩ් (PB 1817) යන සමාගම් ඒකාබද්ධ කිරීම.

2007 අංක 7 දරන සමාගම් පනතේ 244 (3) වගන්තිය ප්‍රකාරව ටැන්සින්ග් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ලැමුරෙප් ඉන්වෙස්මන්ට්ස් ලිමිටඩ් යන සමාගම් ඒකාබද්ධ කර ඇති බවටත් එහි ප්‍රතිඵලයක් ලෙස ලැමුරෙප් ඉන්වෙස්මන්ට්ස් ලිමිටඩ් ඒකාබද්ධ කළ සමාගම විය යුතු බවත් මෙයින් දැනුම් දෙමු. මෙම වැඩපිළිවෙල 2018 ජනවාරි මස 09 වැනි දින සිට බලාත්මක විය. ඒකාබද්ධ කල සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය 94/5 ලොරිස් පාර, කොළඹ 4 වේ.

මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

04-633

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව මෙයින් දන්වා සිටින වග නම්,

1. සමාගමේ නම : සිම්ප්ලි අමේසින් ලංකා ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 130502
ලියාපදිංචි කළ දිනය : 2018 මාර්තු මස 19 වැනිද
ලියාපදිංචි කාර්යාලය : 13බී, ක්ලියර්පොයින්ට් රෙසිඩන්ස්, 1, පෙරේරා මාවත, කොටුවේගොඩ, රාජගිරිය.

2. සමාගමේ නම : ද ස්ටේප්ල්ස් ගෲප් එස් එල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 130782
ලියාපදිංචි කළ දිනය : 2018 මාර්තු මස 19 වැනිද
ලියාපදිංචි කාර්යාලය : 13බී, ක්ලියර්පොයින්ට් රෙසිඩන්ස්, 1, පෙරේරා මාවත, කොටුවේගොඩ, රාජගිරිය.

එන්. කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-634

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : එස්. එම්. වී. හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 131107
ලියාපදිංචි කළ දිනය : 2018 මාර්තු 26
ලියාපදිංචි කාර්යාලය : අංක 90, ගොංගිතොට, වත්තල.

යූ. වි. ඩි. එන්. එල්. කරුණාරත්න,
සමාගම් ලේකම්.

අංක 282/3, වේල්ල වීදිය,
කොළඹ 12.

04-645

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 9 වැනි වගන්තිය අනුව පහත සඳහන් සමාගම ආරම්භ කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : හුවා යු ඉංජිනියරින් කන්ස්ට්‍රක්ෂන් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 130893
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 37, ධර්මකීර්තියාරාම පාර, කොල්ලුපිටිය, කොළඹ 03.
සමාරම්භ කළ දිනය : 2018.03.19

කෝපරේට් ඇඩ්වසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු.

04-646

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 9 වැනි වගන්තිය අනුව පහත සඳහන් සමාගම ආරම්භ කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : ගුඩ් වුඩ් ලම්බර් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 114548
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07.
සමාරම්භ කළ දිනය : 2018.02.19

කෝපරේට් ඇඩ්වසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-647

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම සම්බන්ධ ප්‍රසිද්ධ දැන්වීම.

සමාගමේ නම : Winstar Consultants (Private) Limited
සමාගමේ ලියාපදිංචි දිනය : 2018.03.27
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 131188
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : No. 45, Vembadi Street, Jaffna, Sri Lanka.

Company Secretary.

04-649

## පොදු නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 8 ජේදයේ නියමයන්ට අනුකූලව ''හේලීස් ලෙෂර් හෝල්ඩින්ග්ස් (පීවීටී) එල්ටීඩී'' නාමය ''හේලීස් ඒවියේෂන් ඇන්ඩ් ප්‍රොජෙක්ට්ස් (පීවීටී) එල්ටීඩී'' වශයෙන් වෙනස් කළ බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) ජේදය යටතේ මින් නිවේදනය කරනු ලැබේ.

සමාගම කලින් හැඳින් වූ නාමය : හේලීස් ලෙෂර් හෝල්ඩින්ග්ස් (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පී වී 70644
ලියාපදිංචි කාර්යාලය : අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10.
සමාගමේ නව නාමය : හේලීස් ඒවියේෂන් ඇන්ඩ් ප්‍රොජෙක්ට්ස් (පීවීටී) එල්ටීඩී

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2018 අප්‍රේල් මස 02 වැනි දින,
අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10.

04-650

---

## වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ අප විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ඩී පී එල් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 131136
ලියාපදිංචි කළ දිනය : 2018 මාර්තු මස 26 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 10, 5 වන මහල, ගෝතමී පාර, කොළඹ 08.

ඩී පී එල් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සඳහා සහ වෙනුවෙන්,

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

2018 මාර්තු මස 29 වැනි දින.

04-652

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : වෝල් ස්ට්‍රීට් එන්ටර්ප්‍රයිසස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 129037
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 215, ඒ/2/9, උද්‍යාන පාර, කොළඹ 05.
ලියාපදිංචි දිනය : 2018.01.18

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු).

04-653

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : හුවාවෙයි හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 116856
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 209/ඒ, ගාලු පාර, තල්පිටිය උතුර, වාද්දුව.
ලියාපදිංචි දිනය : 2016.10.03

සමාගමේ නම : ඔසී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 112930
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 108, විලිබුල, හේනේගම.
ලියාපදිංචි දිනය : 2016.04.05

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු).

04-654

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම.

සමාගමේ නම : වෙල් ඇන්ඩ් ඒබල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලියාපදිංචි අංකය : පී වී 128148
සංස්ථාගත කළ දිනය : 2017.12.18
ලියාපදිංචි ලිපිනය : පළමු මහල, සැලසි ගොඩනැගිල්ල, අංක 44, පන්සල පාර, කොළඹ 10.

සමාගම් ලේකම්.

04-656

## මහජනතාව වෙත දැනුම්දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2018 පෙබරවාරි මස 22 වැනි ද පිහිට වූ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ස්කයි බර්ඩ්ස් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම
සමාගමේ අංකය : පී වී 130102
ලියාපදිංචි කාර්යාලය : අංක 14ඒ/සී, හිල් වීදිය, ගම්පොල.

සමාගම් ලේකම්.

04-659

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව, පහත නම සඳහන් සමාගම නිසි පරිදි සංස්ථාපනය කළ බවට දන්වා, කරන දැනුම්දීමයි.

සමාගමේ නම : මහගුරු රොඩ්රිගුවස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම ලියාපදිංචි අංකය : පී වී 130613
ලියාපදිංචි කාර්යාලය : ''ඔරෙක්ස් සිටි'', අංක 555, 4 වන මහල, ඒකල, ජාඇල.
සංස්ථාගත කිරීමේ දිනය : 2018 මාර්තු මස 12 වැනි දින.

සමාගම් ලේකම්.

04-676

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : මුබාරක් ඉන්ටර්නැෂනල් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 129943
ලියාපදිංචි කාර්යාලය : අංක 227, මල්වත්ත, මල්වාන.
සංස්ථාපනය කළ දිනය : 2018.03.15

සමාගම් ලේකම්.

04-677

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පිටකෝට්ටේ, රජමහා විහාර පාර, රජ මාවත, අංක 36, දරන ස්ථානයේ පදිංචි කිත්සිරි ජයලාල් ගජදීරආරච්චි (ජා. හැ. අ.723372798 V) වන මම කොළඹ මහාධිකරණ කලාපයෙහි ධර්මසිරි ගුණවර්ධන, නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කළ, අංක 149 සහ 2009 අප්‍රේල් 28 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රයෙන් මාගේ ඇටෝර්නි බලකරු වශයෙන්

පිටකෝට්ටේ, රජමහා විහාර පාර, රජ මාවත, අංක 36, යන ලිපිනයේ පදිංචි ගජදීර ආරච්චිගේ පියසේන (ජා. හැ. අ. 411371530 V) පත් කරන ලදී. එම ඇටෝර්නි බලපත්‍රය 2018 මාර්තු මස 28 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කළ බවත්, තවදුරටත් එහි කාර්ය සඳහා මා වගනොකියන බවත්, ශ්‍රී ලංකාවාසී සියල්ලන්ටම දැනුම් දෙමි.

කිත්සිරි ජයලාල් ගජදීරආරච්චි.

04-705

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියේ ප්‍රතිපාදනවලට අනුකූලව පහත සඳහන් සමාගම 2018 මාර්තු 9 වැනි දින සංස්ථාගත කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : සැම් හිගේ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 130563
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ක්‍රෙසෙන්ට් රෙසිඩෙන්සීස්, අපාර්ට්මන්ට් 22, ස්ටුවර්ට් ප්ලේස්, කොළඹ 03.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගයක් මගින්.

04-720

---

## දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ මෙම පෞද්ගලික සමාගම සංස්ථාගත කිරීම සිදු කර ඇත.

ආයතනයේ නම : ඩාක් ග්‍රේ (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 210-1/1 මොරටුව පාර, සුවාරපොළ, පිළියන්දල.
ලියාපදිංචි අංකය : පී වී 127493
ලියාපදිංචි දිනය : 2017.11.22

අධ්‍යක්ෂක.

04-721

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඕස්ට්‍රේලියාව, වික්ටෝරියා 3150, ග්ලේන් වේවලි ජෝන් වීදිය, අංක 10 හි පදිංචි රුවන් කුමාර, රාජකරුණා රාජපක්ෂ (ජා. හැ. අංක 751990219 **V**) වන මා විසින් මහනුවර, අම්පිටිය, පොල්වත්ත, අංක 45 දරන ස්ථානයේ පදිංචි දිසානායක මුදියන්සේලාගේ සේනාරත්න බණ්ඩාර විජේකෝන් (ජා. හැ. අංක 431101715 **V**) යන අය වෙත ප්‍රදානය කරන ලද එක්සත් රාජධානියේ සොලිසිටර්වරයකු වන ශන්මුගම් රවීන්ද්‍රන් ඉදිරියේ අත්සන් කරන ලද 2005.03.29 දින ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය වහාම බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන ලද බවත්, එකී දිසානායක මුදියන්සේලාගේ සේනාරත්න බණ්ඩාර විජේකෝන් යන අය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මින් ඉදිරියට මා වග නොකියන බවත්, ඒ හා සම්බන්ධ කිසිදු වගකීමකට නොබැඳෙන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

රුවන් කුමාර රාජකරුණා රාජපක්ෂ.

04-723

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ එල්ලාවල පහලගම ඉහලකන්ද අංක 424/ ඒ/2 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 736821370 **V** හිමි කුඩලුගොඩ ආරච්චිලාගේ රෝහිණී කුසුමලතා වන මම කෝරාළලාගේ නිරෝෂා කෝරාළ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් වර්ෂ 2017ක් වූ අගෝස්තු මස 20 වැනි දින සහතික කළ අංක 1276 දරන සාමාන්‍ය ඇටෝර්නි බලපත්‍රයේ එල්ලාවල පහලගම ඉහලකන්ද අංක 424/ඒ/2 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 620632031 V හිමි අතුකෝරළලාගේ ජයසිංහ හට දෙන ලද ඇටෝර්නි බලය අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමු.

තවද, එකී ඇටොර්නි බලපත්‍රය යටතේ එකී ඇටෝර්නි බලකාර අතුකෝරාළලාගේ යන අය යම් කාර්යයක් කරනු ලැබුවේ නම් ඒ සඳහා මා වග නොකියන බව ද මෙයින් දන්වා සිටිමි.

කුඩලුගොඩ ආරච්චිලාගේ රෝහිණී කුසුමලතා.

04-725

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 09 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත දක්වෙන සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සෝල්ට් ලේක් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 125449
සංස්ථාගත කළ දිනය : 2017.09.12
ලිපිනය : අංක 180, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 03.

එම්. එච්. එම්. ෆස්ලූර් රහ්මාන්,
සමාගම් ලේකම්.

04-733

---

## විශේෂ ඇටෝනි බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ අම්පිටිය, තලාතුඔය පාර, වී. සී. අංක 63/1 යන ස්ථානයේ පදිංචි සෙනවිරත්න මුදලිගේ චන්ද්‍රානි අබයසේකර (ජා. හැ. අංක 565461907 **V**) වන මා විසින් මහනුවර ප්‍රසිද්ධ

නොතාරිස් එම්. යූ. එස්. විතානගේ මහතා විසින් ලියා සහතික කරන ලද අංක 1196 දරන වර්ෂ 2012 ක් වූ මැයි මස 03 වැනි දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් මහනුවර, තලාතුඔය පාර, අම්පිටිය, වී. සී. අංක 63/1 හි පදිංචි අබේසිංහ ආරච්චිගේ ලෙනත් නොහොත් ලේනාඩ් අබේසිංහ (ජා. හැ. අංක 493061992 **V**) වෙත බලය පවරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2018 ක්වූ මාර්තු මස 27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන බවට ශ්‍රී ලංකා රජයටත් මහජනතාවටත් මින් දැනුම් දෙනු ලැබේ. එදින පටන් එකී විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වග නොකියන බව ද තවදුරටත් ප්‍රකාශ කර සිටිමි.

සෙනවිරත්න මුදලිගේ චන්ද්‍රානි අබයසේකර.

වී. සි අංක 63/1,
තලාතුඔය පාර, අම්පිටිය.

04-738

---

## දැන්වීමයි

මාස් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් ලියාපදිංචි අංක පීවී 12995) හි ප්‍රකාශිත ප්‍රාග්ධනය ශ්‍රී ලංකා රුපියල් හතර බිලියන තුන්සිය එක් මිලියන තුන්සිය හතලිස් හතර දහස් තුන්සිය දහයක (4,301,344,310) සිට ශ්‍රී ලංකා රුපියල් නවසිය මිලියන නවසිය හතලිස් හතරදහස් තුන්සිය දහයක් (ශ්‍රී ලංකා රු. 900,944,310) දක්වා අවකරණය කිරීමට යෝජනාවක් පිළිබඳව 2007 අංක 07 දරන සමාගම් පනතේ 59 (2) වගන්තිය ප්‍රකාරව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

04-747

---

## ප්‍රසිද්ධ නිවේදනය

සමිට් ප්‍රොෆෙෂනල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාර 2018 පෙබරවාරි මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සිය නාමය ඉන්ට්‍රෙපිඩ් ගෲප් කළම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස වෙනස් කළ බව එකී පනතේ 8 වැනි වගන්තියෙහි ප්‍රතිපාදන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ කලින් තිබූ නම : සමිට් ප්‍රොෆෙෂනල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 89102
ලියාපදිංචි කාර්යාලය : ලෙවල් 06, තිසර ප්ලාසා, 135, දුටුගැමුණු වීදිය, කොළඹ 06.
සමාගමේ නව නාමය : ඉන්ට්‍රෙපිඩ් ගෲප් කළම්බු (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,
ඉන්ට්‍රෙපිඩ් ගෲප් කළම්බු (ප්‍රයිවට්) ලිමිටඩ්.

04-748

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර දැන්වීමයි

ලියාපදිංචි සමාගමේ නම : ෂින් ලිමාකෝ ඉංජිනියරින් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී.වී 130262
ලියාපදිංචි කළ දිනය : 2018.02.27
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : "සෙනරත්", උඩුපිල, මිරිස්ස

සමාගමේ ලේකම්.

04-751

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 59 (2) වන වගන්තිය යටතේ ආර් එස් බී ලෙන්ඩින් ලිමිටඩ් සමාගමෙහි ප්‍රකාශිත ප්‍රාග්ධනය අවකරණය

2007 අංක 07 දරන සමාගම් පනතේ 59 (2) වන වගන්තිය යටතේ ආර් එස් බී ලෙන්ඩින් ලිමිටඩ් සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් 217,737,930.00 සිට රුපියල් 108,869,030.00 දක්වා අවකරණය සඳහා වූ විශේෂ යෝජනාවක් 2018 ජුනි මස 29 වැනි දින උදේ 10.00 ට අංක 161/ඒ, හිරිඹුර පාර, කරාපිටිය ගාල්ල ස්ථානයේ දී සම්මත කිරීමට නියමිතයි.

උක්ත කරුණ සම්බන්ධයෙන් යම් පුද්ගලයෙකුට, සමාගමකට හෝ ආයතනයකට විරෝධතාවයක් ඉදිරිපත් කිරීමට ඇතොත් එම විරෝධතාවය මෙය පළ වී දින 60ක් ඇතුළත අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 හි සමාගම් රෙජිසට්‍රාර් ජනරාල් වෙත හෝ ඉහත සමාගමේ ලියාපදිංචි ලිපිනය වන අංක 161/ඒ, හිරිඹුර පාර, කරාපිටිය, ගාල්ල යන ලිපිනයට ලිඛිතව දැනුම්දිය යුතු ය.

ඉහත සමාගමේ ලේකම්වරු.

04-785

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ලක්මුතු ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 130710
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 561/66, 1 වීදිය, නව බස් නැවතුම්පල, අනුරාධපුරය.
ලියාපදිංචි දිනය : 2018.03.15

සමාගමේ නම : සරත්චන්ද්‍ර හෝල්ඩිංස් ලංකා (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 106271
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 330/4, උඩුමුල්ල, මුල්ලේරියාව නව නගරය.
ලියාපදිංචි දිනය : 2015.06.12

සමාගමේ නම : ඇල්ෆා ඒස් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 129125
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 7 - 7/1, ඕචාර්ඩ් වෙළඳ සංකීර්ණය, ගාලු පාර, කොළඹ 06.
ලියාපදිංචි දිනය : 2018.01.23

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

04-786

---

## දැන්වීමයි

2007 අංක 07 සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ දැනුම් දෙනු ලැබේ.
සමාගමේ නම : ටොප් ටී. එල්. සී. (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 131126
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 156 1/5, අලුත් කඩේ වීදිය, කොළඹ 12.

අධ්‍යක්ෂ.

04-787

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම දැන්වීමයි

එක්සත් රාජධානිය, CRO 5PX ක්‍රොයිඩන්, සරේ, ග්‍රැන්විල් ක්ලෝස්, නො. 36 සහ ශ්‍රී ලංකාවේ බත්තරමුල්ල, පැලවත්ත, ලියනගේ මාවත, අංක 47/22 හි පදිංචි නීල් තුෂාර ලියනගේ වන මාගේ අත්සනින් යුතුව අංක 2800 හා 2009.02.21 වැනි දිනැති රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවෙහි ලිඛිත බලධාරිකම් හා ඇටර්නි බලපත්‍ර ලේඛනයේ 28 කාණ්ඩයේ 58 පත්‍රයේ 1747 දින පොතේ අංකය යටතේ සටහන් වී ඇති ඇටෝර්නි බලපත්‍රය මගින් බත්තරමුල්ල, මංගල පාර, අංක 13 A හි පදිංචි වැලිවිට කංකානමගේ ලොරානි සමන්තා වැලිවිට යන අයට දෙන ලද මාගේ ඇටෝර්නි බලය අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. ඉහත සඳහන් වැලිවිට කංකානමගේ ලොරානි සමන්තා වැලිවිට යන අය විසින් මින් ඉදිරියට එකී ඇටෝර්නි බලය මගින් කරනු ලබන කිසිදු ගනුදෙනුවකට හෝ ක්‍රියාවකට මා වග නොකියන බව ඉහත සඳහන් සියලු දෙනා වෙත වැඩි දුරටත් දන්වා සිටිමි.

නීල් තුෂාර ලියනගේ.

2018 අප්‍රේල් මස 04 වැනි දින.

04-801

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

සමාගමේ නම : බුවුන් ග්‍රෝ ට්‍රේඩිං (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී.වී 130728
ලියාපදිංචි දිනය : 2018.03.15
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 521 ඒ, රාජපක්ෂ වත්ත, තඹබෝව, නාත්තන්ඩිය.

සමාගමේ නම : කෙනුත් ඉන්ජිනියරින් ඇන්ඩ් කන්සල්ටන්සි (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී.වී 130105
ලියාපදිංචි දිනය : 2018.02.22
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 225, ඇස්වත්ත දකුණ, පුවක්පිටිය.

සමාගමේ නම : කොහු ක්‍රියේෂන්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී.වී 130106
ලියාපදිංචි දිනය : 2018.02.22
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 352, රාජගිරිය පාර, රාජගිරිය.

ආර්. කේ. එල්. එස්. කෝපරේට් සර්විසස් (පීවීටී) එල්. ටී. ඩී., සමාගම් ලේකම්වරු.

04-749

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ඩීඑෆ්සීසී බැන්ක් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු ඉතා වටිනා දේපළක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරළේ අඹගමුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ රොසැල්ල ගමේ පිහිටි ''වුඩ්ලන්ඩ් එස්ටේට්'' නමැති ඉඩමට බලයලත් මානක ඉරන්දතිස්ස කොටඹගේ විසින් 2005.12.27 වැනි දින සාදන ලද අංක 1145A/2005 දරන පිඹුරේ නිරූපිත ලොට් 01 නැමති බෙද වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගහකොළ වගාව ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 12.

